# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 21 දරන නාවික හමුදා සහ ගුවන් හමුදා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 21 දරන නාවික හමුදා සහ ගුවන් හමුදා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 16/78.

**නාවික හමුදා පනත සහ ගුවන් හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1979 අංක 21 දරන නාවික හමුදා සහ ගුවන් හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය.*

**2.** නාවික හමුදා පනතේ 2 වන වගන්තියෙහි සහ ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි සඳහන් “ රාජකීය ලංකා නාවික හමුදාව ” යන යෙදුම වෙනුවට “ ශ්‍රී ලංකා නාවික හමුදාව ” යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ. — *358 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** ගුවන් හමුදා පනතේ 2 වන වගන්තියෙහි සහ ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි සඳහන් “ රාජකීය ලංකා ගුවන් හමුදාව ” යන යෙදුම වෙනුවට “ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ” යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ. — *359 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**4.** යම් ලිඛිත නීතියක හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද හෝ බලය දෙන ලද යම් දැන්වීමක, නිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක රාජකීය ලංකා නාවික හමුදාව හෝ රාජකීය ලංකා ගුවන් හමුදාව යන යෙදුම සඳහන් සෑම පද සම්බන්ධයක දී ම “ රාජකීය ලංකා නාවික හමුදාව ” හෝ “ රාජකීය ලංකා ගුවන් හමුදාව ” යන යෙදුම වෙනුවට පිළිවෙළින් “ ශ්‍රී ලංකා නාවික හමුදාව ” හෝ “ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ” යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය. — *රාජකීය ලංකා නාවික හමුදාව සහ රාජකීය ලංකා ගුවන් හමුදාව යන යෙදුම් වෙනස් කිරීමට ආනුෂංගිකව ලිඛිත නීතියේ සහ ලේඛනවල සංශෝධන.*

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.